# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1979/30 - 2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී- 3/2013

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

අර්ජුන රණතුංග,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2016 ක් වූ ජුනි මස 23 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2016 වෙළඳ නැව් (බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන)නියෝග ලෙස හැඳින්වේ.

2. නැව් බඩු ගෙන යන බහාලුමක සත්‍යායනය කරන ලද දළ ස්කන්ධයට අදාළව, 1960 ජූනි 17 වන දින ලන්ඩනයේ දී අත්සන් තබන ලද මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය සඳහා ආදේශකයක් ලෙස, 1974 නොවැම්බර් 1 වන දින සම්මත කරන ලද, 1980 මැයි 25 වන දින බලාත්මක කරන ලද, 1983 අගෝස්තු 30 වන දින ශ්‍රී ලංකාව විසින් එකඟතාවට පැමිණි සහ 1983 නොවැම්බර් 30 වන දින බලාත්මක භාවයට පැමිණි 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට, මෙම නියෝග මගින් බලාත්මක භාවය ලබා දෙනු ලැබිය යුතු ය.

3. මෙම නියෝගවල විධිවිධාන, පහත සඳහන් බහාලුම් වලට හැර 1972 ආරක්ෂිත බහාලුම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතියට අදාළ වන සියලුම බහාලුම් සඳහා අදාළ විය යුතු ය. එනම් :-

(අ) කෙටි ජාත්‍යන්තර මුහුදු ගමන්හි යෙදෙන, රෝ-රෝ නැවකින් ප්‍රවාහනය කිරීමට නියමිත චැසියක් හෝ ට්‍රේලරයක් මත පිහිට වූ ඇසුරුම්ගත බහාලුමක්;

(ආ) දැනටමත් නැවකට පටවා ඇති බහාලුමක් තුළ අසුරනු පිණිස නැව්කරුවකු විසින් නෞකාධිපතිවරයා වෙත යවනු ලබන නැව් භාණ්ඩ ; සහ

(ඇ) විවෘත මුහුදේ මෙහෙයවනු ලබන ගැඹුරු මුහුදේ බහාලුම් අනුමත කිරීම සඳහා වන මාර්ගෝපදේශ (එම්.එස්.සී/චක්‍රලේඛ. 860) හා සංශෝධිත පරිදි වූ 1972 ආරක්ෂිත බහාලුම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය ඒකාබද්ධව අර්ථ නිරූපණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශෝධිත නිර්දේශවලට (සී.එස්.සී.1/ චක්‍රලේඛ 138/ප්‍රති.1) අනුව, 1972 ආරක්ෂිත බහාලුම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය අදාළ නොවන්නා වූ ගැඹුරු මුහුදේ බහාලුම්.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### *බහාලුම් දළ බර සත්‍යායකයා*

4. (1) (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" ලෙස හඳුන්වනු ලබන), වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම කාර්යය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරිත්වය යටතේ හැර, කිසිදු තැනැත්තකු විසින් බහාලුම් දළ ස්කන්ධ සත්‍යායකයකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම හෝ එහි නිරතවීම කරනු නොලැබිය යුතු ය.

(2) මෙම නියෝගවල, නියෝග අංක 15 යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, පළමු ක්‍රමය හෝ දෙවන ක්‍රමය හෝ එම ක්‍රම දෙකම යටතේ බහාලුම් ස්කන්ධ සත්‍යායකයෙකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යාම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින්, ඒ සම්බන්ධයෙන් වන අයදුම්පත්‍රයක් පහත සඳහන් ලේඛන ද සමග, I වන උපලේඛනයෙහි සඳහන් ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සත්‍යායනය කිරීමේ සහතිකය ;

(ආ) ශ්‍රී ලංකාවේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව විසින් හෝ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අනුමත කරන ලද අධිකාරියක් විසින් නිකුත් කරන ලද ක්‍රමාංකන සහතිකය ;

(ඇ) දළ ස්කන්ධ සත්‍යායනය කිරීමේ සහතිකය නිකුත් කිරීම පිණිස සුදුසු පුද්ගලයකු පත් කිරීමේ ලිපියක් ;

(ඈ) දෙවන ක්‍රමය සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතියක ISO ප්‍රමිති සහතිකය හෝ මෙවලම් නඩත්තු ක්‍රියාවලීන් සහ විසංගණ ක්‍රියාවලීන්හි කොටසක් ලෙස විගණනය කරන ලද සම්මත ක්‍රමවේදයේ පිටපතක්.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් ම, අවශ්‍ය සියලු දත්තයන්හි සම්පූර්ණ හා නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතු අතර, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද ඇතුළත් විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයක ඇතුළත් තොරතුරු සහ දත්ත පිළිබඳව සලකා බැලීමෙන් පසු සහ අයදුම්කරුවකු විසින් මෙම නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන යෝග්‍යතාවට අදාළ අවශ්‍යතා සපුරා ඇති විටෙක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම අයදුම්කරු වෙත එවැනි බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(5) යම් අයදුම්පත්‍රයක සාවද්‍ය, නොමග යවන සුළු හෝ අසත්‍ය තොරතුරු හෝ දත්ත අන්තර්ගත බව පෙනී යන්නේ නම්, එවැනි අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

5. 4 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන ආකෘතියෙන් විය යුතු ය;

(ආ) බලපත්‍රයෙහි දක්වා ඇති පරිදි නියමයන් සහ කොන්දේසිවලට යටත් විය යුතු ය;

(ඇ) බලපත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති යම් දිනයක සිට බලාත්මක විය යුතු ය; සහ

(ඈ) කලින් අවලංගු කළහොත් මිස, බලපත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා බලාත්මක විය යුතු ය.

6. (1) 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, කලින් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගුවීමට දින තිහකට නොඅඩු කාලයට පෙරාතුව, බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව ද සමගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන්, එම කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයක් මාර්ගයෙන් අලුත් කර ගත හැකි ය.

(2) (අ) බලපත්‍රලාභියා විසින් තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කර නොමැති හෝ ඊට පටහැනිව කිසිවක් සිදු කර නොමැති අවස්ථාවක දී ; හෝ

(ආ) බලපත්‍රලාභියා විසින් වෙළඳ නැව් පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක යම් විධිවිධානයක් හෝ උල්ලංඝනය කර නොමැති අවස්ථාවක දී,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ අයදුම්පත්‍රයක් ලැබීම මත බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

7. (අ) වෙළඳ නැව් පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් යටතේ හෝ බලපත්‍රලාභියා විසින් වරදක් කරනු ලැබ ඇති බවට චෝදනා ලද විටෙක දී; හෝ

(ආ) වෙළඳ නැව් පනතෙහි හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක විධිවිධානයක් හෝ බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර ඇති විටෙක දී සහ එවැනි උල්ලංඝනය කිරීමක බරපතල බව, එම බලපත්‍රය අවලංගු කිරීම පිණිස හේතු නොවන විටෙක දී,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටවනු ලැබිය හැකි ය.

8. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්,

(අ) සාවද්‍ය, නොමග යවන සුළු හෝ වැරදි තොරතුරු සැපයීමෙන් ලබාගෙන ඇති බව අනාවරණය වූ විට දී;

(ආ) වෙළඳ නැව් පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් යටතේ හෝ යම් වරදකට බලපත්‍රලාභියා වරදකරු කරනු ලැබ ඇති විටෙක දී; හෝ

(ඇ) එවැනි බලපත්‍රයක් නිකුත් කිරීමේ කවර හෝ නියමයකට හෝ කොන්දේසියකට පටහැනිව හෝ එවැන්නක් උල්ලංඝනය කරමින් බලපත්‍රලාභියා විසින් ක්‍රියා කර ඇති විටෙක දී,

අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) අවස්ථානුකූලව, මෙම නියෝගය හෝ 7 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටවනු ලැබූ විටෙක හෝ අවලංගු කරන ලද විටෙක, බලපත්‍රලාභියා විසින් ලබා දී ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපැල යටතේ කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් මත, එවැනි අත්හිටවනු ලැබීමක් හෝ අවලංගු කිරීමක් පිළිබඳව බලපත්‍රලාභියා වෙත වහාම දැනුම් දීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

9. 4 වන නියෝගය හෝ 6 වන නියෝගය යටතේ අවස්ථානුකූලව, යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම පිණිස ඉදිරිපත් කළ අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප වූ විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එසේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම පිණිස අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ අය වෙත එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු කිරීම පිළිබඳව හේතු වාර්තා කළ යුතු ය. අයදුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපැල යටතේ කරනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින්, එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සඳහා වූ හේතු, එවැනි අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන අයකු වෙත දැනුම් දීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

10. 1 වන ක්‍රමය හෝ 2 වන ක්‍රමය භාවිත කිරීම පිණිස බලපත්‍රයක් නිකුත් කරන ලද ඕනෑම තැනැත්තකු දත්ත පද්ධතියක් තුළ ලියාපදිංචි කළ යුතු ය. අනුමත නැව්කරුවන් හා ප්‍රවාහකයින් (නැව් සමාගම්) හා වරාය හෝ පර්යන්ත මෙහෙයුම්කරුවන් යන දෙඅංශයටම මෙම දත්ත පද්ධතියට ප්‍රවේශ වීමට හැකි විය යුතු ය.

## II වන කොටස

### *බහාලුම් ප්‍රවාහකයින්*

11. (1) එම කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිත්වය යටතේ හැරුණු විට, කිසිදු තැනැත්තකු විසින් ප්‍රයිම් මූවර්, ලොරි හෝ ට්‍රේලර් ඇතුළු බහාලුම් ප්‍රවාහකයකුගේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම හෝ එහි නිරත වීම නොකළ යුතු ය.

(2) ප්‍රයිම් මූවර්, ලොරි හෝ ට්‍රේලර් ඇතුළු බහාලුම් ප්‍රවාහකයකුගේ ව්‍යාපාරයක් කරගෙන යාමට අපේක්ෂා කරන යම් තැනැත්තෙක් විසින් ඒ සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට පහත සඳහන් ලේඛන ද සමගින්, III වන උපලේඛනයෙහි සඳහන් ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය. එනම් :-

(*අ*) වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්;

(*ආ*) රක්ෂණ ගිවිසුමේ පිටපතක්;

(*ඇ*) පූර්ණ අයිතිය පිළිබිඹු කෙරෙන ආකාරය;

(*ඈ*) අනුමත බිම් තරාදියකින් ලබා ගත් බර සත්‍යායනය කිරීමේ සහතිකය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක්ම, අවශ්‍ය සියලු දත්තයන්හි සම්පූර්ණ හා නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතු අතර, මෙහි II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ද ඇතුළත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයක ඇතුළත් දත්ත සහ තොරතුරු සලකා බලමින් සහ මෙම නියෝගය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම පිණිස වන යෝග්‍යතාවට අදාළ අවශ්‍යතා අයදුම්කරු විසින් සපුරා ඇති විටදී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයදුම්කරු වෙත එවැනි බලපත්‍රයක් නිකුත් කළ හැකි ය.

(5) යම් අයදුම්පත්‍රයක සාවද්‍ය, නොමග යවන සුළු හෝ අසත්‍ය තොරතුරු හෝ දත්ත අන්තර්ගත බව පෙනී යන්නේ නම්, එවැනි අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

12. මෙම කොටස යටතේ බලපත්‍ර සම්බන්ධයෙන්, 5, 6, 7, 8 සහ 9 වන නියෝගවල අන්තර්ගත විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## III වන කොටස

### *සාමාන්‍ය*

13. සෑම නැව්කරුවකු විසින් ම,

(*අ*) නැව් බඩු ගෙන යන බහාලුමක දළ ස්කන්ධය සත්‍යායනය කිරීම සඳහා; සහ

(*ආ*) සත්‍යායනය කළ දළ ස්කන්ධය නාවික ලේඛන තුළ ප්‍රමාණවත් ලෙස කල් වේලා ඇතිව සන්නිවේදනය කරනු ලබන බවට සහතික වීම සඳහා,

වගකිව යුතු ය.

14. නැව්කරුගේ ලේඛන තුළ, ඇසුරුම්ගත බහාලුමෙහි සත්‍යායනය කරන ලද දළ ස්කන්ධය සැපයීමට අපොහොසත් වූ විටෙක දී, බහාලුමෙහි සත්‍යාපිත දළ ස්කන්ධය කල්වේලා ඇතිව නෞකාධිපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා සහ පර්යන්ත නියෝජිතයා විසින් ලබා ගෙන ඇත්තේ නම් මිස බහාලුමක් නැවකට නොපැටවිය යුතු ය.

15. ඇසුරුම්ගත බහාලුමක සත්‍යායනය කරන ලද දළ ස්කන්ධය ලබා ගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් පරිදි ක්‍රම දෙකක් තිබිය යුතු ය. එනම් -

(අ) පළමුවන ක්‍රමය ලෙස හඳුන්වනු ලබන ක්‍රමාංකිත හා සහතික කරන ලද බර කිරුම් උපකරණ භාවිත කරමින් ඇසුරුම්ගත බහාලුමෙහි බර කිරීම ;

(ආ) දෙවන ක්‍රමය ලෙස හඳුන්වනු ලබන, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සහතික කළ ක්‍රමයක් භාවිත කරමින් බහාලුමෙහි ඇසිරිය යුතුවන පිහිටවුම්, ස්ථාපනයන් හා සෙසු ඇසුරුම් ද්‍රව්‍ය හා පිහිටවුම් ද්‍රව්‍ය ද ඇතුළත් සියලු නැව්බඩු අයිතම හා ඇසුරුම්හි බර කිරීම සහ ඒකල සමූහයන් හි එකතුවට බහාලුමෙහි හිස් ස්කන්ධය එක් කිරීම.

16. (1) බහාලුම් මතුපිට පැහැදිලිව සහ ස්ථිර ලෙස ඇසුරුම් සහ නැව් බඩු අයිතමවල නිවැරදි ස්කන්ධ සඳහන්, වෙන් වෙන් වශයෙන් වූ, නියමාකාර ලෙස මුද්‍රා තබන ලද ඇසුරුම්, බහාලුමෙහි ඇසුරූ පසු නැවත බර මනිනු නොලැබිය යුතු ය.

(2) කැබලි ලෝහ, මලුගත නොකළ ධාන්‍ය හා වෙනත් සමූහ වශයෙන් පවත්නා ඇතැම් වර්ගවල නැව්බඩු අයිතම ආදී, බහාලුම් තුළ ඇසුරුම්ගත කිරීම සඳහා භාණ්ඩ ඒකක වශයෙන් බර කිරීමේ පහසු හැකියාවක් නොමැති ඒවා සම්බන්ධයෙන් දෙවන ක්‍රමය යෝග්‍ය මෙන්ම ප්‍රායෝගික නොවන අතර, ඒ වෙනුවට පළමු ක්‍රමය යොදා ගත යුතු ය.

(3) දෙවන ක්‍රමය යටතේ බහාලුම් අන්තර්ගතයෙහි බර මැනීම සඳහා යොදා ගනු ලබන ක්‍රමය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි සහතික කිරීමට සහ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය.

17. පොදු ජනතාවගේ යහපත උදෙසා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම නියෝග යටතේ කලින් කලට නිකුත් කළ හැකි මාර්ගෝපදේශ සෑම සේවා සපයන්නෙකුම විසින් අනුගමනය කළ යුතු ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නියෝගවල-

"ක්‍රමාංකිත හා සහතික කරන ලද උපකරණ" යන්නෙන්, ශ්‍රී ලංකාවේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ නිරවද්‍යතා ප්‍රමිතීන් හා අවශ්‍යතා සපුරාලන්නා වූ ද, ඇසුරුම්ගත බහාලුමක හෝ ඇසුරුම් හා නැව් බඩුවල, පිහිටවුම්, ස්ථාපනයන් හා සෙසු ඇසුරුම් හා ආරක්ෂිත ද්‍රව්‍යවල සැබෑ දළ ස්කන්ධය තීරණය කිරීමේ හැකියාව සහිත තරාදියක්, බිම් තරාදියක්, එසැවුම් උපකරණයක් හෝ වෙනත් යම් උපකරණයක් අදහස් කෙරේ;

"නැව් බඩු අයිතම" යන්නට, සංශෝධිත පරිදි වූ, 1972 ආරක්ෂිත බහාලුම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ "නැව් බඩු" යන යෙදුමට සමාන සාමාන්‍ය අර්ථයම ඇති අතර, එහිලා ප්‍රවාහන කොන්ත්‍රාත්තුවකට අනුකූලව බහාලුම් තුළ ප්‍රවාහනය කෙරෙන යම් භාණ්ඩ, ද්‍රව්‍ය, වෙළඳ භාණ්ඩ, ද්‍රව, වායු, ඝන ද්‍රව්‍ය හා ඕනෑම වර්ගයක ද්‍රව්‍ය අදහස් කෙරේ. එසේ වුව ද, නැවේ අමතර කොටස් හා ගබඩා ඇතුළත්ව බහාලුමක ප්‍රවාහනය කෙරෙන නැවේ උපකරණ හා නැවේ සැපයුම් නැව්බඩු වශයෙන් නොසැලකේ;

"බහාලුම" යන්නට, සංශෝධිත පරිදි වූ, 1972 ආරක්ෂිත බහාලුම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියෙහි "බහාලුම" යන්නට දී ඇති අර්ථයම ඇති අතර, එමෙන්ම,

(අ) ස්ථිර ස්වභාවයේ පවත්නා අතර එබැවින් නැවත නැවතත් භාවිත කිරීමට සුදුසු වන තරම් ශක්තිමත් වූ;

(ආ) අතරමැද නැවත පැටවීම් රහිතව, එක් ප්‍රවාහන මාදිලියකින් හෝ කිහිපයකින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට පහසුකම් සැලසීම සඳහා විශේෂයෙන් නිමවන ලද;

(ඇ) මෙම කාර්යයන් සඳහා අවශ්‍ය කොන් පිහිටවුම් සහිතව, ආරක්ෂිතව හෝ පහසුවෙන් හැසිරවිය හැකි අයුරින් නිමවන ලද; සහ

(ඈ) පිටත පතුල් කෙළවර හතර මගින් ආවරණය වන ක්ෂේත්‍රය,

(i) අවම වශයෙන් වර්ග මීටර 14 (ව.අඩි 150); හෝ

(ii) එහි මුදුන් කොන් පිහිටවුම් සවිකර ඇත්තේ නම් අවම වශයෙන් වර්ග මීටර් 7 (ව.අඩි 75) ලෙස වූ ප්‍රමාණයේ වූ;

ප්‍රවාහන උපකරණ ද්‍රව්‍යයක් අදහස් කෙරේ;

"දළ ස්කන්ධය" යන්නෙන්, බහාලුමෙහි හිස් ස්කන්ධය හා බහාලුම තුළට අසුරන ලද පිහිටවුම්, ස්ථාපනයන් හා සෙසු ඇසුරුම් ද්‍රව්‍ය හා ආරක්ෂිත ද්‍රව්‍ය ද ඇතුළත්ව සියලු ඇසුරුම් හා නැව් බඩු උපකරණයන් හි ඒකාබද්ධ ස්කන්ධය අදහස් කෙරේ;

"ඇසුරුම" යන්නෙන්, ප්‍රවාහනය සඳහා එකට ගොනු කළ, ඇසුරුම් කළ, ඔතන ලද, පෙට්ටිගත කළ හෝ පාර්සල් කළ නැව්බඩු අයිතම එකක් හෝ ගණනාවක් අදහස් කෙරේ. පාර්සල්, පෙට්ටි, පැකට් හා සෙසු ඝන කඩදාසි පෙට්ටි ඇසුරුම් සඳහා උදාහරණ වන නමුදු ඇසුරුම් යන්න මේ උදාහරණයට පමණක් සීමා නොවේ;

"ඇසුරුම්ගත බහාලුම්" යන්නෙන්, පෙර අර්ථනිරූපණය කරන ලද පරිදි, පිහිටවුම්, ස්ථාපනයන් හා සෙසු ඇසුරුම් ද්‍රව්‍ය හා ආරක්ෂිත ද්‍රව්‍ය ද ඇතුළත් ද්‍රව, වායු, ඝන, ඇසුරුම් හා නැව්බඩු අයිතමයන් පටවන ලද (පුරවන ලද හෝ ගොඩ ගසන ලද) බහාලුමක් අදහස් කෙරේ;

"නැව"යන්නෙන්, මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ (SOLAS) VI වන පරිච්ඡේදය අදාළ වන්නා වූ ඕනෑම යාත්‍රාවක් අදහස් කෙරේ. වැසියක හෝ ට්‍රේලරයක් මත බහාලුම් ගෙන යනු ලබන්නා වූ ද, අදාළ ප්‍රවාහන නෞකාවෙන් පිටතට හා එය තුළට එම බහාලුම් පදවනු ලබන්නා වූ ද, කෙටි ජාත්‍යන්තර මුහුදු ගමන්වල නියුතු රථවාහන ප්‍රවාහක යාත්‍රා (රෝ-රෝ නැව්) මෙම අර්ථ නිරූපණයෙන් බැහැර කෙරේ;

"නැව්කරු" යන්නෙන්, නැව්කරු වශයෙන් නෞභාර පත්‍රයෙහි හෝ නැව්බඩු ලදුපත හෝ ඒ හා සමාන බහුවිධ ප්‍රවාහන ලේඛනයක (උදා: නෞභාර පත්‍රය "මගින්" ලෙස) නැව්කරු ලෙස නම්කර ඇති නෛතික ආයතනය හෝ තැනැත්තා හෝ නැව් සමාගම සමග ප්‍රවාහන කොන්ත්‍රාත්තුවක් අවසන් කර ඇති අය (හෝ යම් අයකුගේ නමින් හෝ ඔහු වෙනුවෙන් එසේ කර ඇත්නම් ඒ අය) අදහස් කෙරේ;

"නාවික ලේඛනය" යන්නෙන්, ඇසුරුම්ගත බහාලුමෙහි සත්‍යාපිත දළ ස්කන්ධය සන්නිවේදනය පිණිස නැව්කරු විසින් භාවිත කරනු ලබන ලේඛනය අදහස් කෙරේ. මෙම ලේඛනය නැව් සමාගම වෙත නිකුත් කෙරෙන නාවික උපදේශයෙහි කොටසක් හෝ වෙනම ම වූ සන්නිවේදනයක් (උදා: බර කිරුම් ස්ථානයකින් නිකුත් කරන ලද බර සහතිකයක් ඇතුළත් ප්‍රකාශනයක්) විය හැකි ය;

"කෙටි ජාත්‍යන්තර මුහුදු ගමන්" යන්නෙන්, නැවේ ගමන් ගන්නා මගීන් හා නාවික කණ්ඩායම සුරක්ෂිතව ගොඩ බැස්සවිය හැකි වරායකට හෝ ආරක්ෂිත ස්ථානයකට සැතපුම් 200 ක් නොඉක්මවූ දුරකින් ස්වකීය ජාත්‍යන්තර මුහුදු ගමනේ දී අදාළ නැව පිහිටන්නා වූ හා මුහුදු ගමන ආරම්භ කළ රටේ අවසන් වරාය හා ගමනාන්ත වරාය අතර දුර සැතපුම් 600 නොඉක්මවන්නා වූ මුහුදු ගමන් අදහස් කෙරේ;

"පර්යන්ත නියෝජිතයා" යන්නෙන්, නැවකට සම්බන්ධ වාප්පු ගාස්තු, නෞකාගාර, බඩු ඇහුරුම් කුලී, ගුදම් හෝ සෙසු නැව්බඩු හැසිරවීම ආශ්‍රිත සේවා සැපයීමෙහි නියැලී සිටින නෛතික ආයතනයක් හෝ පුද්ගලයකු වෙනුවෙන් ක්‍රියාකරන්නා වූ තැනැත්තකු අදහස් කෙරේ;

"සත්‍යාපිත දළ ස්කන්ධය" යන්නෙන්, ක්‍රමවලින් එකක් මගින් ලබාගත් පරිදි වන ඇසුරුම්ගත බහාලුමක සමස්ත දළ ස්කන්ධය අදහස් කෙරේ.

*I වන උපලේඛනය*

*(4(2) වන නියෝගය)*

**බහාලුම් දළ බර සත්‍යායකයෙකු (අපනයනකරුවෙකු/බිම් තරාදි ක්‍රියාකරුවකු) ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම :
2. ලියාපදිංචි ලිපිනය :
3. දුරකථන අංකය : .......................................... ෆැක්ස් අංකය : ........................................

   විද්‍යුත් ලිපිනය :
4. බහුවිධ පරිශ්‍රයන් උදෙසා, සත්‍යාපනය කළ ස්කන්ධය මැනීම සිදු කරනු ලබන ලිපිනය :
5. ක්‍රමය (යෝග්‍ය ක්‍රමය ලකුණු කරන්න) :

   1 වන ක්‍රමය ☐

   2 වන ක්‍රමය ☐

   බිම් තරාදිය ☐
6. මෙහෙයුම් අධ්‍යක්ෂ/ප්‍රවර්ධන කාර්ය මණ්ඩලය ආදී වූ වගකිව යුතු පුද්ගලයා/පුද්ගලයන්ගේ නම් :
7. නැව්කරුවන්ගේ ප්‍රකාශ අත්සන් තැබීම පිණිස බලයලත් මාණ්ඩලික නිලධාරියාගේ නම සහ අනන්‍යතාවය :
8. පෙර බලපත්‍ර අංක පිළිබඳ තොරතුරු (අදාළ වන්නේ නම්) :

මෙම බලපත්‍ර මගින් ආවරණය කරනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ ලිඛිත නීතියෙහි විධිවිධාන පිළිබඳව අප විසින් සම්පූර්ණ වශයෙන් දැනුවත් බව අපි සහතික වන්නෙමු.

අපගේ දැනුම සහ විශ්වාසය පරිදි, මෙම අයදුම්පත්‍රයෙහි ඇතුළත් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට අපි ප්‍රකාශ කරමු.

දිනය : ................................ .................................................

බලයලත් නිලධරයාගේ නම සහ අත්සන

*II වන උපලේඛනය*

*(4(3) වන නියෝගය)*

| විෂයය | ඒකකයක් සඳහා බලපත්‍ර ගාස්තුව |
|---|---|
| 1. බහාලුම් දළ බර සත්‍යායක (අපනයනකරු/බිම් තරාදි) | රුපියල් 12,500.00 |
| 2. බහාලුම් ට්‍රක්රථ, ප්‍රයිම් මූවර් හෝ ලොරි | රුපියල් 500.00 |
| 3. ට්‍රේලර් | රුපියල් 250.00 |

*III වන උපලේඛනය*

*(11(2) වන නියෝගය)*

බහාලුම් දළ බර සත්‍යායකයෙකු (ප්‍රයිම් මූවර්/ලොරි/ට්‍රේලර්) ප්‍රවාහකයෙකු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ එවැනි බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ නම :
2. ලියාපදිංචි ලිපිනය :
3. දුරකථන අංකය : .......................................... ෆැක්ස් අංකය : ........................................

   විද්‍යුත් ලිපිනය :
4. වාහනයේ ලියාපදිංචි අංකය :
5. ප්‍රයිම් මූවරයේ/ට්‍රේලරයේ/ලොරියේ හිමිකාරත්වය පිළිබඳ තොරතුරු :
6. ප්‍රයිම් මූවරයේ/ට්‍රේලරයේ/ලොරියේ දළ බර :
7. නවීකරණ විස්තර තිබේ නම්, එම විස්තර :
8. බර සත්‍යාපන සහතික අංකය :

අපගේ දැනුම සහ විශ්වාසය පරිදි, මෙම අයදුම්පත්‍රයෙහි ඇතුළත් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට අපි ප්‍රකාශ කරමු.

දිනය : ................................

.................................................
බලයලත් නිලධරයාගේ නම සහ අත්සන

09 - 62

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.